# පොලොන්නරු ගල් විහාර පිළිම සම්බන්ධ ව නව මතයක්

රවීන්ද්‍ර ඒ. බණ්ඩාර

ස්වාධීන පර්යේෂක.

**Abstract**

The Gal Vihara built by King Parakramabahu can be identified as the place with the greatest works of stone sculpture belonging to the Polonnaruwa period. In this location, we can also observe two statues of the Buddha in the posture of Samadhi, a Hitipilimaya statue and a Parinirvana statue. Various views have been put forward by the early historians regarding these statues. Many theories and assumptions were mostly written about the standing statue (Hitipilimaya). D.T. Devendra and S.M. Baros declared and published that this statue is in the image of Ananda Thero. (Lagamuwa, 1999. Page 148) One other scholar has also endorsed this theory. Although various views were expressed regarding the positioning of the hands of this statue (Hands tied to it's chest), Ven. Prof. Kamburupitiye Vanaratana Thero proposed that this is the Ashisha pose while Prof. Paranavithana suggested that it is the Paradukkha Dukkhitha pose.However, early scholars have failed to present a unified theory on all four of these statues. I would like to present my theory that all four of these statues together represent an all-encompassing character description of the Buddha. In explication I postulate the following to be depicted from the Polonaruwa stone sculptures. Firstly, that the Samadhi statue outside the Vidyadhara cave is a reflection of the meditational process required for enlightenment. Secondly that the Samadhi statue inside the Vidyadhara cave, represents the understanding of the philosophies of Dibba Chakkhu, Pubbeniwasanussathi and Asawawakkhaya Gnana and eventually the achievement of enlightenment. . Thirdly that the Hitipilimaya statue describes the life of the Buddha during the 45 year period of his life after enlightenment. Finally that the Parinirvana statue depicts the preaching of the last words of the Buddha and the attaining of Parinirvana. This is referred to as "Nirupadesha Nirwaana

Dhathuwen Parinirwanayata Pathweema“. Thus it is my opinion that these statues represent the rise to enlightenment, enlightenment, 45 years of Dharma preaching and Sambuddha Pariniravanaya of the Buddha.

***Key Words**:* Gal Vihara, King Parakramabahu, Hitipilimaya, statue

**හැඳින්වීම**

මූර්ති නිර්මාණය සඳහා ගල්, ගඩොල් සහ බදාම මෙන් ම, දැව ද යොදාගෙන තිබේ. දැවමය මුද්‍රා ඉක්මණින් විනාශවන හෙයින් බොහෝ විට විනාශ වී ගොස් ඇත. කෙසේනමුත්, අනුරාධපුර යුගයේදී මෙන් ම, මෙම යුගයේ ද පිළිම තුන් ආකාරයකට නෙලා ඇති බව පැහැදිලි වේ. එනම්,

1. වැඩ සිටින පිළිම
2. හිටි පිළිම
3. සැතපෙන පිළිම හෝ පිරිනිර්වාණ පිළිම වශයෙනි.

එහෙත්, පොළොන්නරු විහාරවල තිබෙන සෑම පිළිමයක් ම එම යුගයට ම අයත් බව පැවසිය නොහැකිය. පබළු වෙහෙර හා ථූපාරාමය යනුවෙන් හඳුන්වනු ලබන ස්ථානවල ඇති පිළිම මෙයට නිදර්ශන වේ. පරණවිතාන මහතා පවසන පරිදි මෙම පිළිම අනුරාධපුර යුගයේ රුවන්වැලි දාගැබේ හෝ මැදිරිගිරියේ තිබෙන පිළිමවලට වෙනස් නොවේ (පරණවිතාන, 1971. 572). එමෙන් ම, පබළු වෙහෙරේ ඇති බෝධිසත්ව ප්‍රතිමා සම්බන්ධව ද එතුමා දරන්නේ එවැනි ම අදහසකි. නමුත්, මහා විජයබාහු රජු විසින් කරවන ලද දළදා මළුවේ ගන්ධ කුටියේ ඇති පිළිමය තරමක් වෙනස් වේ.

පොළොන්නරු යුගයට අයත් බව නිශ්චිත වශයෙන් ම පැවසිය හැකි ප්‍රතිමා ඇත්තේ පොළොන්නරුවේ ගල් විහාරය යනුවෙන් හඳුන්වනු ලබන තැනය. මෙහි ප්‍රතිමා පළමුවන පරාක්‍රමබාහු රජු විසින් කරවන ලද බව මහාවංසය ඉඳුරාම පවසයි. (ම.ව,පරි.78.ගාථා.73 --75) එමෙන් ම, මෙහි ඇති ගල්විහාර සන්නස නිසා ද මෙම මතය සනාථ වේ (E.Z.VOI.II.P.273). නමුත්, මෙම පිළිම හතර ම එකී යුගයට අයත් නොවන බව "සියලු කර්මයන් දක්වා විද්‍යාධර ගුහාව ද වැඩහුන් පිළිම ලෙනක් ද හොත් පිළිම ගුහායෙක් දැයි මෙසේ පිළිම ලෙන් තුනක් දක්ෂ වූ ශිල්පීන් ලවා කරවූයේ ය." (ම. ව, පරි. (78. ගාථා. 80-81). මේ අනුව, පරාක්‍රමබාහු රජු පිළිම තුනක් පමණක් කරවූ බව පෙනේ. මේ පිළිම තුනෙන් ගල් ලෙන තුළ ඇති පිළිම අනෙක් පිළිමවලට වඩා පැරණි බවට මත ඉදිරිපත් වී තිබුන ද වැඩියෙන් ඇති පිළමය හිටි පිළිමය බව දේවේන්ද්‍ර පෙන්වා දෙයි (දේවේන්ද්‍ර, 2007. 57). කරුණු මෙසේ නම්, මහා පරාක්‍රමබාහු රජු විසින් වෙනත් පිළිමයක් තිබූ තැනක බුද්ධ රූප තුනක් නෙළීම ගැන මහාවංශ කතු නිශ්ශබ්ධ වූ බව පෙනේ. මේ සම්බන්ධ අදහස් දැක්වූ මහාචාර්ය පරණවිතාන මහතා 1960 දී ප්‍රකාශ කර ඇත්තේ හිටි පිළිමය අනෙක් බුද්ධ රූප තුනට පෙර ඉදිකළ බවය (UCHC.p.60). එහෙත්, ඊට වර්ෂ අටකට පෙර ඔහු සඳහන් කර ඇත්තේ මේ පිළිම තුන ම පැරකුම් රජ දවස ඉදිකරන ලද බවයි (AA.XYp.216). නමුත්, දේවෙන්ද්‍ර පෙන්වා දෙන්නේ මේ හිටි පිළිමය පරාක්‍රමබාහු රජ දවසට පෙර ඉදිකරණ ලද්දක් බවයි (දේවේන්ද්‍ර, 2007. 59). මේ

ප්‍රතිමා පැහැදිලි ලෙස ම අනුරාධපුර ප්‍රතිමාවලින් වෙනස් වේ. එහි මුහුණුවල ස්වභාවය අනුරාධපුර ප්‍රතිමාවලට වඩා වෙනස් වේ. පස්සට නැඹුරු පටු නළල් තලය ගල් විහාර පිළිමවල පැහැදිලි ලක්‍ෂණයක් වේ. සිවුරේ රැළි සකසා ඇති ආකාරය ද වෙනස් වේ. කෙසේනමුත්, බුදුන් වහන්සේගේ ආධ්‍යාත්මික ගුණ වන මහා ප්‍රඥාව, මහා කරුණාව අනුරාධපුර යුගයේ පිළිම තරම් මූර්තිමත් කිරීමට මෙම ශිල්පියා සමත් වී නොමැත. ගල් විහාරයේ තිබෙන සුවිශාල ම බුදු පිළිමය වන්නේ සැතපෙන යනුවෙන් පැවසෙන බුදු පිළිමයයි. මෙය අඩි 46 අගල් 4 ක් දිගය. මෙහි ඇති අනෙක් වැදගත් පිළිමය වන්නේ අඩි 15 අගල් 2 1/2 උසැති වැඩහුන් හෙවත් හිඳි බුද්ධ ප්‍රතිමාවයි. මෙම පිළිමය සමාධි මුද්‍රාවෙන් හා වීරාසනයෙන් යුක්ත වන අතර, මෙහි ප්‍රතිමා තලය මුහුණතෙහි වජ්‍ර ලාංජන සහිත උක්කුටියෙන් සිටින සිංහ රූප පෙළක් ඇත. සිංහ රූප මඟින් බුදුරදුන්ගේ ශාක්‍ය සිංහ භාවය ගම්‍ය කරන බව උගතුන් පවසයි. වජ්‍ර සංකේතයෙන් උන්වහන්සේ මුළු ලොවට ම පූජනීය බව ද පවසනු ලබයි. දෙනෙත අඩවන්ව නිරූපණය කර ඇති අතර, බුදුන් වහන්සේ සමාධි සුවයෙන් වැඩ සිටින ආකාරය මෙයින් විශද වේ. මෙහි ස්වභාවිකව පිහිටි පර්වතය කැන ස්ථම්භ දෙකක් ද කැටයම් කර ඇති විද්‍යාධර ගුහාව තුළ ඇති හිඳි පිළිමය අනෙක් හිඳි පිළිමයට වඩා කුඩා වේ. එහි සිරස්පත හැර උස අඩි 4 අගල් 7 කි. ප්‍රතිමා පීඨය උසින් අඩි 2 අගල් 9 1/2 කි. ප්‍රභා මණ්ඩලයේ විශ්කම්භය අඩි 1 අගල් 10 කි. මේ ප්‍රතිමාව පිටු පස ආරුක්කු සහිත තොරණක් වේ. එහි කුළුණු දෙකට බද්ධ කොට අං සහිත සිංහරූප දෙකක් නිරූපණය කර ඇත. බුදුන් වහන්සේගේ හිසට ඉහළින් ඡත්‍රයක් වැනි වියනක් තිබේ. අඩි 2 ක් පමණ උස අත් සතරක් ඇති දේවතා රූප දෙකක් මෙහි ඇති අතර, ඒවා විද්‍යාධරයන්ගේ යැයි සමහරු පවසති. බෙල් මහතාගේ අදහසට අනුව, එහි ඇත්තේ බ්‍රහ්ම හා විෂ්ණු රූපය (ASCAR 1907 P.7) අතීතයේ මෙම මුළු ලෙන ම බිතුසිතුවම්වලින් පිරී තිබෙන්නට ඇත.

ගල් විහාරයේ දක්නට ලැබෙන වැදගත් ම පිළිමය වන්නේ එහි ඇති හිටි පිළිමයයි. මේ හිටි පිළිමය උසින් අඩි 22 අගල් 9 ක් වේ. මේ හිටි පිළිමයේ සිරුර ඍජුව නිර්මාණය කර නොමැත. කෙසේනමුත්, උගතුන් අතර, මේ පිළිමය සම්බන්ධව විවිධ මත පවති. ඇතම් උගතුන් පවසන පරිදි සැතපෙන පිළිමය පිහිටා තිබේ.

**ගල් විහාර පිළිම සම්බන්ධ ව නවමතයක්.**

**පළමු සමාධි පිළිමය**

විද්‍යාධර ගුහාවේ පිටත ඇති සමාධි මුද්‍රාවෙන් යුක්ත පිළිමය තුළින් සිද්ධාර්ථ ගෞතමයන් වහන්සේ බුද්ධත්වයට පත්වීම සඳහා වීරිය වැඩීම නිරූපණය වන බව පෙනේ. මේ වීරිය පුරුෂයාණෝ ශරීරයේ සම, මස්, ලේ, ඇට, නහර වියැලී සුණු විසුණුව ගියත් පුරුෂස්ථානයෙන්, පුරුෂ වීරියෙන්, පුරුෂ පරාක්‍රමයයෙන් ලැබිය යුතු සම්බෝධි ඥානය ලැබ මිස නොනැගිටින්නේ යන අධිෂ්ඨානයෙන් යුක්තව අපරාජිත පර්‍යංකයේ චතුරංග වීරියෙන් යුතුව වැඩ ඉඳීම මෙයින් නිරූපණය වේ (රවීන්ද, 2021. පි.579). මෙහි වජ්‍ර සංකේතයක් දක්නට ලැබේ (ලගමුව, 1999. පි.145). සිද්ධාර්ථ ගෞතමයන් වහන්සේ බුද්ධත්වය පතා ඇසතු ගසට පිට දී පෙරදිග බලා වැඩ සිටියේ අජේය පරියංකය නොහොත් වජ්‍රාසනයෙනි (ආනන්ද හිමි, 2000. පි. 63).

සමාධි මුද්‍රාවෙන් නිර්මාණය කර ඇති මෙම පිළිමයේ උස අඩි 15.2 1/2, වේ. සිද්ධාර්ථයන් මාරයා පරාජය කර ගැඹුරු ධ්‍යානකට සමවදින ආකාරය මෙම

ප්‍රතිමාව දෙස බලන විට මනාව පැහැදිලි වේ. වජ්‍රාසනයෙන් බෝ මැඩ වැඩ හුන් විට බෝසතාණන් වහන්සේගේ ශරීරයෙන් නිකුත් වූ ස්වර්ණ වර්ණ ප්‍රභාවලිය නිසා මුළු පෙදෙස ම ආලෝකමත් වූ බව පැවසේ. මේ ප්‍රතිමාවේ දී නිරූපිත ප්‍රභාවලිය තුළින් එය සංකේතවත් වන්නට ඇති බව සිතිය හැකිය.

ලලිතවිස්තරයේ සඳහන් ආකාරයට සිද්ධාර්ථයන් බෝමැඩ වෙත ප්‍රවේශ වන්නේ සිංහයකු හා සමානව දැඩි වීරියකින් යුක්තව ය. එමෙන් ම, සිරුර කෙළින් තබාගෙන සිහියෙන් යුක්තව බෝමැඩ ට පිට දී හිඳගන්නා සිද්ධාර්ථයන් ඕනෑ ම අභියෝගයක් ජයගෙන සම්‍යක් සම්බෝධි ඥානය පසක් කරගන්නා අධිෂ්ඨානයෙන් සිහි නුවණින් සිටි. මේ සමාධි පිළිමයෙන් ද එදා බෝ මැඩ අසල සිදු වූ සිදුවීම් ප්‍රතීය මූර්තිමත් කරණ අයුරු පෙනේ. එය මේ ප්‍රතිමාව සමීපයෙහි ඇති සිංහ රූපයෙන් මනාව පැහැදිලි වේ. සිංහයෙකු මෙන් දැඩි අධිෂ්ඨානයෙන් තමාගේ අරමුණු වෙත ප්‍රවේශ වීම මෙමගින් නිරූපණය කරයි. මේ පිළිමයේ මුළු කය ම ඍජුව පිහිටා ඇති අතර, සිවුර ඒකාංශ කොට පොරවා ඇත. එමෙන් ම, මෙහි ලම්භකරණ, ගෙලෙහි ත්‍රිවලිය, අක්බඹර කේෂ කලාපය, සිහින් දෙතොල්, දිගු නාසය, සිහින් ඇහි බැම් උත්තරීතර පෞරුෂය පෙන්වනු ලබන සාධකයෝ වෙති.

මෙහි බුදුන්ගේ හිස ආවරණය වන පරිදි ආරුක්කුවක් ද වෘත්තාකාර කවයක් ද කවය තුළ නෙලුම් මල් ද නිරූපිතය. මේවා විමාන වැනි ගොඩනැගිලි ආකෘතිවලින් යුක්ත වේ. එනේ ම, මෙලෙස නිරූපිත මන්දිර පහක බුද්ධ ප්‍රතිමාව යැයි සිතිය හැකි ප්‍රතිමා රූප පහක් පෙනේ. මෙම නිර්මාණ පිළිබඳ විචාරාක්ෂිය යොමු කරන කල්හි ලලිතවිස්තරය එන සඳහනක් සිහියට නැගේ. එනම්,

"ඉක්බිති ඊසාන දිසාවේ "හේමජාලාප්‍රතිච්ජන්නා" නැමැති ලෝක ධාතුවේ" රත්නච්ජත්‍රාභ්‍යුද්ගතවභාස" නම් තථාගතයන් ගේ බුද්ධ ක්ෂේත්‍රයේ වැඩ සිටින "හේම ජාලාකෘත" නම් බෝධි සත්වයා මහා සත්වයාණන්ගේ ආලෝකයෙන් අසංඛ්‍ය වූ බෝධිසත්වයන් පිරිවරාගෙන පෙරටුකර කරගෙන බෝධිසත්වත්වයන් වැඩ සිටි බෝධි මණ්ඩලය යම් තැනක ද එතැනට එළැඹියේ ය. එළඹ බෝධිසත්වයන්ට පූජා කිරීම සඳහා එම කූටාගාර යේ මැණික් විමාන මත දෙතිස් මහා පුරුෂ ලක්ෂණයන්ගෙන් යුක්ත බෝධි සත්වයා ගේ අලංකාරකාර ප්‍රතිමාවක් නිර්මාණය කළේය. බෝධි සත්වයා ගේ සියලු ප්‍රතිමා දිව්‍ය මනුෂ්‍ය මල් මාලා රැගෙන් බෝධිසත්වයන් යම් තැන්ක ද එතැනට එළඹ උන්වහන්සේ වෙත නැමී මල්මාලා ද පැළඳ වීය" (ගුණසෝම හිමි, 2001. 303).

මේ සඳහන සාකච්ඡාවට භාජනය වන සමාධි පිළිමය වටා ඇති කැටයම් කෙරෙහි මොන තරම් උචිත ගැලපීමක් තිබෙන්නේ ද යන්න පැහැදිලි වේ. ඉහතින් සඳහන් කළ එහි ඇති විමාන වලින් මූර්තිමත් වන්නේ මේ දෙව් බඹුන් හා අසංඛ්‍ය වූ බෝධිසත්වයන් විසින් ද නිර්මාණය කරන ලද විමාන විය හැකිය. එමෙන් ම, ඔවුන් යොදන ලද මල් මාලා නෙළුම් මල් වලින් නිරූපිත වන්නට ඇත.

මේ අනුව, පෙනෙන්නේ බෝධිසත්ත්වයන් බවුන් වැඩීම සඳහා බෝධි මූලයෙහි හිඳගැනීම්ත් සමඟ දෙව් බඹුන්, අසංඛ්‍යය බෝධිසත්වයන් බෝමැඩ සමීපයට පැමිණීමයි. මේ සාධක තුළින් විද්‍යාධර ගුහාවෙන් එපිට ඇති සමාධි පිළිමයෙන් බුදු වීමට බවුන් වැඩීම නිරූපණය වන බව පැහැදිලි වේ. එමෙන් ම, මෙහි දේවරූපය නොමැත. එයට ද බලපාන ලද ප්‍රධාන සාධකයක් තිබේ. මේ මහා වීරයාණන් මාර පරාජය කරන

මොහොතේ ඇති වූ දුර්නිමිති දැක රැස්ව සිටි දෙවි බඹුන් මාරයාට බියෙන් එතනින් ඉවත් වීමයි.



බෝධිසත්වයාණන් වහන්සේ කෙලෙස් ප්‍රහීනය යට සිත යොමු කරන විට පැවති මංගල උත්සව ක්‍ෂණයෙන් නැවතිණි. බෝධි මූලයට රැස්ව සිටි දේව බ්‍රහ්මයෝ එවෙලෙහි ආචාර්ය සතුරෙකු දැකීමෙන් හිස් ලූ ලූ අත දිව ගත් බව බුද්ධ චරිතයෙහි සඳහන්වේ (ආනන්ද හිමි, 2015. 64). එවිට ඝන අන්ධකාරයක් ඇතිවිය. අහස ධූමකේතු වලින් යුක්ත විය. චණ්ඩ වාතය සතර අත හැමීය. මෙලෙස අසුබ අනිටු දුර්නිමිති පහළ වන විට දේව බ්‍රහ්මයෝ එතැනින් ඉවත් විය.

නමුත්, මේ මහා වීර පුරුෂයාණෝ ඒ දුර්නිමිති වලට හෝ මාරයාගේ ගර්ජනා වලට බිය නොවී සම්බෝධි ඥානය පසක් කරගැනීමේ අරමුණින් සිටියේය. එවිට මාරයා,

"මහණ මෙබඳු රළු යකෙකු වූ මා දැක බිය නොගන්නෙහි ඇයි දැයි ඇසීය.

එසේය මාරය නොපාබාමියි. බෝසතාණන් වහන්සේ වදාළ සේක.

කුමක් හෙයින් නොබානෙහි දැයි මාරයා ඇසීය.

මා දානාදි පෙරුම් දම් පිරූ හෙයිනැයි බෝසතාණන් වහන්සේ වදාළ සේක.

යුෂ්මත්හු පින් කළා යැයි කවරෙක් දනී දැයි මාරයා ඇසීය.

එවිට බෝසතාණන් වහන්සේ

මාරය මෙහිලා දොස් දැක්වීම කුමට ද අවශ්‍ය නම් එක් වෙසතුරු අත් බැව්හි පමණක් දුන් දනිම් සත්යලක් කම්පිත වූ මේ මහ පොළව ම දෙස් වෙයි වදාරා" (එම, 65-66). මෙලෙස දානාදි පාරමිතා බලයෙන් මාරයා පරාජය කළ බව ද ඉන් මතු ධ්‍යානයෙන් ධ්‍යානයට සමවැදෙමින් සම්බෝධි ඥානය පසක්කර ගැනීමට ප්‍රවේශ වීම මෙමගින් නිරූපිතය. මාරයා පරාජය කරන විට මාර සේනාවට බිය වූ දෙවි බඹුන් එතැනින් පලා යාම නිසා මෙහි දේව බ්‍රහ්ම රූප සිතුවම් නොවීමට හේතුවක් විය. මේ අනුව, ප්‍රථම සමාධිය පිළිමය බෝමැඩ අබියස මාර පරාජය කර බුද්ධත්වයට පත් වීම් නිරූපණය වන බව පෙනේ.

**විද්‍යාධර ගුහාව සමාධි පිළිමය**

විද්‍යාධර ගුහාවේ ඇති සමාධි පිළිමය වීරාසනයෙන් යුක්ත වන අතර, මෙම ප්‍රතිමාව තුළින් සිද්ධාර්ථ බෝසතාණෝ සම්බෝධි ඥාණය ට පත්වීම් නිරූපණය කරනු ලබයි. මාර පරාජයෙන් පසු මහා වීර පුරුෂයාණෝ පළමුකොට ආනාපානාසතිය වඩා පළමු, දෙවැනි, තෙවැනි හා සිවුවැනි රූපාවචර ධ්‍යානයන්ට සම වැදුණේය. මෙලෙස චතුර්ථත් ධ්‍යානය දක්වා ප්‍රවේෂ වූ උන්වහන්සේ සමාධි සිතින් යුතුව රාත්‍රියේ ප්‍රථම යාමයේ දී දිබ්බ චක්‍ෂු ඤාණ දර්ශනය අවබෝධ කරගත්තේය (ගුණසෝම හිමි, 2001. 356). දිබ්බ චක්‍ෂු ඥාන දර්ශනය ලැබීමෙන් පසු මිනිසත් බව අතික්‍රමණය කරන දිවැසින් සත්වයන් දෙස බලමින් ඔවුන්ගේ සංසාර ගමන පිළිබඳව අවබෝධය ලැබීම සිදුවිය.

මෙසේ මිනිසුන්ගේ ඉපදීම, මියයෑම යනාදී සංසාර චක්‍රය පසක් කරගත් උන්වහන්සේ රාත්‍රී මධ්‍යම යාමයේ දී පුබ්බේනිවාසානුස්සති ඤාණය ලැබිය. එමගින් සත්වයන්ගේ විවිධාකාර වූ පෙර විසූ භවයන් නැතහොත් කඳපිළිවෙළ දැකීමේ හැකියාව ලැබිණි. කවර නම් ගොත් සහිතව සත්වයා සංසාර චක්‍රයේ ගමන් කළේ ද යන්න පසක් කරගැනීම මේ ඤාණ දර්ශනය තුළින් සිදු විය.

ඉන්මතු, නැවතත් සමාධියෙන් යුක්ත වූ උන්වහන්සේ රාත්‍රීයේ අන්තිම යාමයේ අරුණෝදය නැගෙන හෝරාවේ ආසවක්ඛ්‍ය ඤාණ දර්ශනය පසක් කළේය. ඉන්පසු උන් වහන්සේ පටිච්ච සමුප්පාදය අනුලෝම ප්‍රතිලෝම වශයෙන් මෙනෙහි කරමින් මෙලෙස,

- දිබ්බ චක්ඛු
- පුබ්බේනිවාසානුස්සති
- ආසවක්ඛය

යන ත්‍රිවිද්‍යාවෙන් ඤාණයෙන් යුක්තව දුකට පත්වන තෘෂ්ණාව නිරෝධනය කරන මාර්ගයත් චතුරාර්ය සත්‍යයත් පසක් කරගෙන කරගෙන වෙසක් පොහෝ දින අලුයම් යාමෙ සම්බෝධි ඤාණය ට පත්විය. මෙලෙස ත්‍රිවිද්‍යා පසක් කර සම්බෝධි ඤාණයට පත්වීම විද්‍යාධර ගුහාවේ ඇති සමාධි පිළිමයෙන් නිරූපණය වේ. ඒ සඳහා මනා සාක්ෂි ද එහි තිබේ. එනම්, මේ පිළිමය ස්වේෂචත්‍රයෙන් ආවරණය කර තිබෙන අතර, ඒ වටා වූ අහස් කුසේ දේව බ්‍රහ්ම සමූහයා බුදුන්ට ගෞරවාදර දක්වන ඉරියව්වලින් නිරූපණය කර තිබේ, එමෙන් ම, බුදුන් වහන්සේට චාමර සලමින් සිටින රූප දෙකක් ද මෙහි දක්නට ලැබේ, ප්‍රතිමාවට ඉදිරියෙන් කෙලින් ම පැරණි බෝධිය පිහිටා තිබූ බවට සාධක තිබේ



**බුද්ධත්වයට පත් වූ බව දැක්වෙන සමාධි පිළිම**

දනට විද්‍යාධර ගුහාවේ ශේෂව ඇති මෙම සිතුවම් හා ලක්ෂණ සිද්ධාර්ථ බෝසතාණන් වහන්සේ බුද්ධත්වයට පත් වූ මොහොතේ ඇති වූවා යැයි පැවසෙන සිදුවීම් වලට බෙහෙවින් සමාන වේ. උන්වහන්සේ බුද්ධත්වයට පත්වන විට එතැනට රැස්වූ දෙවියන් මල් වස්සන්නට සූදානම් විය (ගුණසෝම හිමි, 2001. 363). නමුත්, පෙර බුදුවරයන් ද බුද්ධත්වයෙන් පසු නිමිති දක්වන තෙක් මල් ඉස්සවීම සිදුනොකළ බව දේවතාවන් පැවසූ අතර, දෙවියන්ගේ මේ විමතිය උන්වහන්සේ දුරු කිරීමෙන් පසු දෙවියෝ මල් වස්සවා උන්වහන්සේ වන්දනා කළහ. එවිට, පියවරින් පියවර එතැනට පැමිණි දෙවියන්, බ්‍රහ්මයන් උන් වහන්සේ වන්දනා කළහ. මෙම තත්ත්වය විද්‍යාධර ගුහාවේ ඇති සමාධි පිළිමයට ඉහළින් ඇති දෙවියන්, බ්‍රහ්මයන් බුදුරදුන් වන්දනා කරන අයුරින් නිරූපිතය. දෙව් බ්‍රහ්මයන්ගේ සිතුවම් තුළින් විද්‍යාධර ගුහාවේ ඇති සමාධි පිළිමයෙන් බුද්ධත්වයට පත්වීම නිරූපණය වන බව පැවසිය හැකිය.

**හිටි පිළිමය**

ගල් විහාර පිළිම අතර වැඩි වශයෙන් ම සාකච්ඡාවට භාජනය වී ඇත්තේ එහි ඇති හිටි පිළිමය යි. මේ හිටි පිළිමය ලාංකික මූර්ති කලාවේ විශිෂ්ට නිර්මාණයක් බව නම් අවිවාදාත්මක කරුණකි. කෙසේනමුත්, මේ පිළිමය සම්බන්ධයෙන් මතභේදාත්මක තත්ත්වයන් විශාල වශයෙන් දක්නට ලැබේ. ඩී.ටී දේවේන්ද්‍ර, (දේවේන්ද්‍ර, 2007.57) එස්. එම් බාරෝස් (USCAR,1907.p14) වැනි අය මෙම පිළිමය ආනන්ද හිමියන්ගේ පිළිමයක් බව පවසයි. එච්.සී.පී. බෙල් මහතා ද මෙම මතය අනුමත කර තිබේ. හෝකාට් මහතා මෙය බුදුරදුන්ගේ ප්‍රතිමාවක් බවට මතයක් ඉදිරිපත් කළේය. එමෙන් ම, පරණවිතාන ඇතුළු උගතුන් මෙම පිළිමය බුදුරජාණන් වහන්සේගේ පිළිමයක් බව පවසයි එමෙන් ම, ප්‍රේමතිලක, රෝලන්ඩ් ද සිල්වා වැනි උගතුන් මෙම ප්‍රතිමාව බුදුන් වහන්සේ අනිමිසලෝචන පූජාව පවත්වන අයුරු නිරූපිතයි බව පවසා තිබේ (ලගමුව, 1999, 149).

ද්විභංග ඉරියව්වෙන් යුක්ත මෙම ප්‍රතිමාව තුළ යම් අයුරකින් සක්මන් කරන ස්වභාවයක් ද නිරූපණය වේ. එහි දණහිස හා ඉගටිය යන දෙතැනින් ශරීරයේ රිද්මය බිඳී ඇත. එය සකමන් කරණ ඉරයව්වට ගැලපේ (රවීන්ද්‍ර, 2022. 580). මහුණේ ස්වරූපය ද මෙයට ම ගැලපේ. මෙම පිළිමය මගින් සත්සතියේ තුන්වන අවස්ථාව වන රුවන් සක්මනෙහි සක්මන් කිරීම මෙයින් නිරූපිත බව මහාචාර්ය ලගමුව මහතා පෙන්වා දී තිබේ (ලගමුව, 1999, 49). එමෙන් ම, මේ පිළිමයේ පා තබා ඇත්තේ නෙලුම් මලක් මතය හිසකෙස් සකසා ඇති අයුරු බුද්ධ රූපයකට සමානය. සියලු සම්බාධකවලින් දුරුවී සියල්ල් ජයගත් සැහැල්ලු කරුණා මෛත්‍රීය ඔපනැන්වෙන උපශාන්ත ස්වරූපයක් මෙම පිළිමයෙන් මූර්තිමත් වේ. දැත් පපුවේ බැඳ ඇති බුද්ධ ප්‍රතිමා කිහිපයක් රිටිගල, යටාල වෙහෙර, දඹුල්ල හා හිඟගල යන විහාරවලින් ලැබී තිබේ (පරණවිතාන. 1971. 370). මේ සාධක සමග සසඳන කළ හිටි පිළිමය පැහැදිලි අර්ථයෙන් ම බුදුරදුන්ගේ යන්න මාගේ විශ්වාසය වේ. එමෙන් ම, මේ පිළිමය සම්බන්ධව අපගේ දෘෂ්ටිය ට අනුව, මෙමගින් උන් වහන්සේ බුද්ධත්වයෙන් පසු ගතකළ පන්සාලිස් වසක ජීවිත කාලය සම්පූර්ණයෙන් ම නිරූපණය වෙයි. පරණවිතාන මහතා පවසන පරිදි මෙම ප්‍රතිමාවේ දැත් පපුවේ බැඳගෙන සිටීම තුළින් "පරදුක්ඛ දුක්ඛිත" මුද්‍රාව නිරූපණය වේ (එම, පි.349). නමුත්, අනෙකුත් උගතුන් ගේ අදහස් මෙන් ම මේ සම්බන්ධව පරණවිතාන මහතා ඉදිරිපත්

කරන අදහස් එක එල්ලේ බැහැර කිරීම්ට සිදුවේ. කවර හෙයින් ද යත් බුදු කෙනෙකු යනු අටලෝ දහමින් කම්පා වන පුද්ගලයකු නොවන හෙයිනි. අනුන්ගේ දුකේ දී උන්වහන්සේ කම්පිත නොවේ. ඒ දෙස උපේක්ෂාවෙන්වෙන් බලනු ලබයි. අනුන්ගේ දුකේ දී කම්පාවේ නම් උත්තරීතර පුද්ගලයන් හා පුහුදනන් අතර, කිසිදු වෙනසක් නොමැත (රවීන්‍ද්‍ර, 2021. 580). එනිසා ම, පරණවිතාන මහතා ඉදිරිපත් කරන "පරදුක්ඛ දුක්ඛිත" යන අදහස් බැහැර කිරීම්ට සිදුවේ. එමෙන් ම, මහාචාර්ය පරණවිතානයන් ගේ අදහස සම්බන්ධව අදහස් දක්වන ලද හෝකාර්ට් පෙන්වා දී තිබෙන්නේ මේ පිළිමය දීර්ඝ කාලයක් වැසි සුළං ආදී ස්වභාවික උවදුරුවලට ගොදුරු වීම නිසා එහි හැඩයේ වෙනස්කම් වෙමින් දුක්ඛිත ස්වරූපයක් නිරූපණයවන බවයි (CJS(G)Vol II.p.15).

එසේනම්, මේ පිළිමයෙන් මූර්තිමත් වන්නේ කුමක් ද? ප්‍රථම සමාධි පිළිමයෙන් බුද්ධත්වයට බවුන් වැඩීම ද විද්‍යාධර ගුහාවේ සමාධි පිළිමයෙන් ත්‍රිවිද්‍යා පසක් කර බුද්ධත්වයට පත්වීම ද පෙන්වනු ලබන බව ඉහත දී පෙන්වා දෙනු ලැබූ අතර, එසේ නම් එමඟින් බුද්ධත්වයට පත් වීමෙන් පසු ගත කරන ලද පන්සාලිස් වසක ජීවිත කතාව පිළිබිඹු වේ. සත් සතිය ගත කළ බුදුරජාණන් වහන්සේගේ සිතට මන්දෝත්සාහී ස්වභාවයක් දැනුණු බව අරියපර්යේෂණ සූත්‍රයේ සඳහන්වේ. (අරියපරියේසන සූත්‍රයේ PTS) ඒ සම්බන්ධව මෙලෙස සඳහන්වේ.



**බුදුරදුන්ගේ පන්සාලිස් වසක ජීවිත කතාව දැක්වෙන හිටි පිළිමය**

"මහණෙනි ඒ මට මෙසේ අදහස් විය. මා විසින් අවබෝධ කරගන්නා ලද ධර්මය ගැඹුරු ය. දැකීම් දුෂ්කර ය. අවබෝධ කරගැනීම අමාරුය. මේ සත්ත්ව ප්‍රජාව පංච කාමයෙහි ඇලී සතුටු වන්නේය...... රාගයෙන්, ද්වේෂයෙන් මඩනා ලද්දවුන් විසින් මේ ධර්මය පහසුවෙන් තේරුම්ගත නොහැකි වේ. ගඟ උඩු අතට ගැලීමක් වැනිය. සියුම් වූ ගැඹුරු වූ අවබෝධයක් අප හසු වූ අතිශයින් සියුම් වූ ධර්මය රාගයෙන් රත් වූ මෝහෙන් වටවූ මේ සත්වයෝ අවබෝධ කර නොගන්නා හ. (එම)

මෙලෙස ධර්මයේහි ඇති ගැඹුරු භාවය නිසා එම සුගන්ධවත් ධර්මය අවබෝධ කරගැනීමට හැකි පිරිසක් සිටී ද යන විපරිතය උන්වහන්සේගේ සිතට දැනිණි. ඉන්මතු,

සහම්පතී මහා බ්‍රහ්මයා මේ බව දැන ධර්මය තේරුම් ගැනීමට හැකි පිරිස් සිටින බවත් ධර්ම දේශනා කරන ලෙසටත් බුදුරදුන්ගෙන් අයැද සිටියේය. ඉන්පසු දිවැසින් බැලූ උන්වහන්සේ ධර්ම දේශනයට සිත් පහළ විය (විජේරත්න, 2012. 12-13).

මෙතැනින් ධර්ම දේශනයට යොමු වූ සිතින් යුතුව පස්වග මහණුන්ට ධම්මචක්කපවත්වන සූත්‍රය දේශනා කිරීමෙන් ඇරඹි බුදුරදුන් ගේ ලෝකහිතාය චර්යාව මෙම ප්‍රතිමාවෙන් නිරූපණය වේ. එතැන් පටන් පරිනිර්වාණය දක්වා උන්වහන්සේ දෙව් මිනිසුන්ගේ හිතසුව පිණිස ධර්ම චාරිකාවේ නිරත වූ පන්සාලිස් වසක ජීවිත කතාව මෙම පිළිමයෙන් මූර්තිමත් කෙරෙන බව අපගේ විශ්වාසයයි.

**පරිනිර්වාණ පිළිමය**

බුදුරදුන් එදා පිරිණිවන් මංචකයේ සැතපීමත් සමඟ දිව්‍ය බ්‍රහ්ම සේනාව සුවඳ සුළු මල් වගුරුවමින් දිව්‍ය ගීත වාදනය කළ බව බුද්ධ චරිතයේ සඳහන්වේ (ආනන්ද හිමි, 2000. 258). එවිට බුදුරදුන් ආනන්ද හිමියන්ට ප්‍රකාශ කරසිටියේ ආමිසයෙන් බුදුරදුන්ට කරන පූජා තුළින් උන්වහන්සේට කිසි ගෞරවයක් නොලැබෙන බවත් යම් පුද්ගලයෙක් බව ලෝකෝත්තර ධර්මය අවබෝධ කරගැනීමට කටයුතු කරන්නේ නම් එයින් උන්වහන්සේට නිසි ගෞරවය ලැබෙන බවත් ඒවන විට පිරිනිවන් මංචකයේ වැඩ සිටි බුදුරදුන් ට උපවාන තෙරුන් පවන් සලමින් සිටි අතර, උන්වහන්සේගේ ඉර්ධි බලය නිසා දෙවියන්ට බුදුරදුන් දැක ගැනීමට නොහැකි විය. බුදුරදුන් උපවාන තෙරුන්ට එම නිසා එතනින් ඉවත් වන ලෙස දැන්වීය. අනතුරුව අනාගාමී රහත් දෙවියන් හැර සෙසු දෙවියන් වැලපෙමින් බුදුන් වන්දනය කළේය.

ආනන්ද හිමියන් අසන ලද ප්‍රශ්න වලට අනතුරුව පිළිතුරු ලබා දෙන ලදී (දීඝ. නි. 1999. පරිනිබ්බාන සූත්‍රය. 240-250). ඉන්මතු, මහා සුදස්සන සූත්‍රය දේශනා කළ අතර, ආනන්ද හිමියන් යවා මල්ලව යන්ට එදින සම්බුද්ධ පරිනිර්වාණය සිදු වන බව දන්වා සිටියේය. එමෙන් ම, සුභද්‍ර නම් අන්තිම ශ්‍රාවකයාගේ ප්‍රශ්නය නිරාකරණය කළ උන්වහන්සේ (ආනන්ද හිමි, 2000.පි 290) අවසන් වශයෙන් භික්ෂූන් අමතා,

"හන්දදානි භික්ක වේ ආමන්තයාමි වො

වයධම්මා සංඛාරා අප්පමාදේත සම්පාදේථ" (එම, පි. 354)

යනුවෙන් අවසන් බුදු වදන පවසා පුථුජ්ජන භික්ෂූන් හඬාවැටීම හා සියලු සංස්කාර ධර්මයන් නැසෙන සුලු බව අවබෝධ කරගත් රහතන් වහන්සේලා උපේක්ෂාව මධ්‍යයේ පළමු ධ්‍යානයට ද ඉන් දෙවන ධ්‍යානයට ද සමවැදී දෙවන ධ්‍යානයෙන් නැගී තෙවන ධ්‍යානයට ද සමවැදී ඉන් සිව්වන ධ්‍යානයට ද එතැනින් ආකාසානඤ්චායතන සමවතට ද ආකාසානඤ්චායතන සමවතින් නැගී විඤ්ඤාණඤ්චායතන සමවතට ද සමවැදී එතැනින් ආකිඤ්චඤ්ඤායතන සමවතට ද ඉන් නැගී නේවසඤ්ඤානාසඤ්ඤායතන සමවතට සමවැදී එතනින් නැගී සංඥා වේදයිත නිරෝධ සමවතට සමත්ව පරිනිර්වාණයට පත් වීම මෙම පරිනිර්වාණ ප්‍රතිමාවෙන් කියවේ.



**සම්බුද්ධ පරිනිර්වාණය දැක්වෙන පිළිමය**

## නිගමනය

ගල් විහාරය මහා පරාක්‍රමබාහු රාජ්‍ය සමයේ ඉදිකරණ ලද්දක් බව මහාවංශය පවසයි. නමුත්, මහාවංශය පවසන පරිදි එහි ඉදිකර තිබෙන්නේ පිළිම තුනකි. පසුකාලීනව හිටි පිළිමය ඉදිකරණ ලද බව ඇතැම් උගුන් ප්‍රකාශකාර තිබේ. ගල් විහාරය සම්බන්ධව විවිධ උගතුන් කාලයෙන් කාලයට විවිධ මත ඉදිරිපත් කර තිබි. එකී මතවාදවලින් ඇතැම් ඒව තත්කාලීන ගෞරවයට පාත්‍ර වූ අතර ම, ඇතැම් මතවාදයන් කාලයත් සමග ප්‍රතික්ෂේප වී තිබේ. මේ අතර, පී.ඊ.ඊ ප්‍රනාන්දු, මහාචාර්ය පී. එල්. ප්‍රේමතිලක, මහාචාර්ය කඹුරුපිටියේ වනරතන හිමි යන උගතුන් ගල් විහාරයේ මහායාන ලක්ෂණ පවතින බවට ද මතයක් ගෙනෙන ලදී (ලගමුව, 1999. 145). කෙසේනමුත්, සිංහල කාලා ශිල්පියා බෞද්ධ ආභාෂය මෙන් ම, බුද්ධ චරිතය මනාව පෙන්වනු ලබන ස්ථානයක් ලෙස ගල් විහාර පිළිම ගොඩ නගන ලද බව අපට හැගේ.

ගල් විහාර බිමෙහි ඇති බුද්ධ ප්‍රතිමා හතර බුදුරදුන්ගේ ජීවිතයේ සුවිශේෂි කාලපරිච්ජේද හතරක් නිරූපණය වන බව මාගේ විශ්වාසය වේ. එනම්,

1. විද්‍යාධර ගුහාවෙන් පිටත සමාධි පිළිමයෙන් බුද්ධත්වයට පත්වීමට බවුන් වැඩීම.
2. විද්‍යාධර ගුහාවේ සමාධි පිළිමයෙන් බුද්ධත්වයට පත්වීම.
3. හිටි පිළිමයෙන් බුදුන් වහන්සේ සත්වයාගේ සංසාර ගමන දෙස උපේක්ෂාවෙන් බලා ධර්ම චාරිකාවේ යෙදුන පන්සාලිස් වසක කාල සීමාව
4. සම්බුද්ධ පරිනිර්වාණ

## ආශ්‍රිත ග්‍රන්ථ


මහාවංසය, (සිංහල), (2015) බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, නැදිමාල, දෙහිවල.

මහාවංසය, දෙවන වෙළුම, (2015) වික්‍රමගමගේ චන්ද්‍රා, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, නැදිමාල, දෙහිවල.

ආනන්ද මෛත්‍රිය හිමි, (2015) සිද්ධාර්ථ ගෞතම බුද්ධ චරිතය, සමයවර්ධන පොත්හල. කොළඹ.

ගුණසෝම හිමි ඊරුවැව, (2021) ලලිතවිස්තරය, සමයවර්ධන පොත්හල. කොළඹ.

දීඝනිකාය (සිං), (1999) බෞද්ධසංස්කෘතික මධ්‍යස්ථානය, නැදිමාල, දෙහිවල.

ශාසන ඉතිහාසය, (2014) බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව.

ලගමුව ඒ. (1999) මධ්‍යකාලීන රාජධානිය පොළොන්නරුව, සරසවි, නුගේගොඩ.

කොඩ්රිංටන් එච්. ඩබ්ලිව්, (2009) සංක්ෂිප්ත ලංකා ඉතිහාසය, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

ශාසනරතන හිමි, (2012) ලක්දිව මහායාන අදහස්, විසිදුණු ප්‍රකාශකයෝ, බොරලැස්ගමුව.

අමරවංස හිමි, (1969) ලක්දිව සෙල්ලිපි, ගුණසේන.

දේවේන්ද්‍ර ඩී. ටී. (2007) සඳකඩපහණ හා වෙනත් ලිපි, ගොඩගේ, කොළඹ.

වනරතන හිමි කඹුරුපිටියේ, (1962) පොළොන්නරුවේ නටඹුන් ගුණසේන සහ සමාගම, කොළඹ.

විජේරත්න ඒ. කේ, (2012) බෞද්ධ සංස්කෘතිය, කතෘ ප්‍රකාශන.

බණ්ඩාර ඒ. රවීන්ද්‍ර, (2021) අසිරිමත් ලංකාව. සමන්ති ප්‍රකාශකයෝ, ජා - ඇල

ලංකා ඉතිහාසය - I කාණ්ඩය, II භාගය. (1971) විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය.

ගල් විහාර ගිරි ලිපිය - EZ. Vol, II, P.256-283

Permathilaka P.L and Karunarthna L.K (1992) Polonnaruwa The Meieval Capital CCF Colombo
H.C.P. Bell, ASCAR. 1907.14

CJSC(G),Ip.lXLIII